
# මහින්ද ප්‍රසාද් මස්ඉඹුල



2012

# ඇහි පියන් ඇහැරිලා

Scanned with CamScanner

# ඇහි පියන් ඇහැරිලා

(කාව්‍ය සංග්‍රහය)

මහින්ද ප්‍රසාද් මස්ඉඹුල

සන්ථව ප්‍රකාශනයක්

Scanned with CamScanner

# පිදුම

සන්තකට ම තිබු සියල්ල
මට දී යළි නො ම ගත්තයි
ඇත්තට ජීවිතේ පුරා
නුඹ මා එක්ක යි සිත් වෙයි
මං වෙත ඒ කාලෙ පැව
කතා ගොඩයි කවි රොත්තයි
හින්ද ම මේ හැම නුඹට යි
ඒක එහෙම ම යි - සත්තයි

ටිකක් පරක්කු වුණත්
මේ ඔක්කොම කවි ටික

අපේ කිරිඅම්මාට යි...

Scanned with CamScanner

අරුංගල් නොමැති ගැමි කෙල්ලකගෙ කනේ
කරපිංචා සුවඳ මට නුඹෙ කවියෙ දනේ

- රණතුංග මල්ලවආරච්චි

Scanned with CamScanner

# කිරිඅම්මාගේ කාව්‍ය සාහිත්‍යය

"තරිකිට කුදං එන කුමංද
දිරිකිට කඩං කෝපි ලන්ද
ගෙන ඩිංගෝ ගිරා කැත්ත
මෙකිගෙ කොණ්ඩේ කපන්න"

ඒ කිරිඅම්මා නිතර කියන කවියකි. අපේ කිරිඅම්මා හරි පුදුම කෙනෙක් ය. ඒ එකල මා ගම වටේ රැගෙන ගොස් ලෝකය ගැන, මිනිස්සු ගැන, ගහකොළං ගැන නොයෙක් පාඩම් කියා දුන්නා ය. කාව්‍ය යන දේහි යම් තාලයක් වේ නම් එය මා හඳුනාගත්තේ කිරිඅම්මාගෙන් කියා හිතේ. ඕ හරි ම අපූරු කවි පාඩම් කරගෙන, ඒවා නිතර එක එක තාලවලට ගායනා කළා ය. ඒවා උගත්තේ කොහෙන් ද යි ඇසූ කල, 'මිනිස්සු කියනව මට ඇහිල තියෙනවා බං' යි කීවා ය. ඒ මිනිස්සු කවුද? මට මහත් ප්‍රහේලිකාවක් විය. කවුරු වුණත් ඒ මිනිස්සු නම් හරි ම අමුතු ම ජාතියක් විය යුතු යැ යි මම කල්පනා කළෙමි.

එකල අපි රක්වානට පයින් ගියෙමු. කඳුවැටි, දියඇලි, තේවතු පසු කරගෙන යන ඒ ගමනේදී ඉතා පුදුම හිතෙන කතා ඕ කීවා ය; බක බක ගා සිනා සුණා ය. කිරිඅම්මා සිරුරින් ඉතා පුංචි ය; අපට ගොඩක් ආදරේ ය.

දැන් ගොඩකවෙල තැපැල් කන්තෝරුව ඇති තැන එකල ටෙන්ට් එකක් දමා, එහි චිත්‍රපට පෙන්වූ බවත් තමා ඒ සියල්ල බැලූ බවත් කිරිඅම්මා මා සමග කීවා ය. ඇඩී ජයමාන්න කෝලම්කාරයෙක් නිසා ඔහු රුක්මණී දේවියට කොහෙත් ම නොගැළපෙන බව මට කීවේ ද කිරිඅම්මා ය.

එකල කුඩා මම කිරිඅම්මා සමඟ රක්වානේ, බුළුවානේ, බුළුගහහේනේ, තියඹරාවත්තේ නෑදෑ ගෙවල්වල ගියෙමි. අපි පයින් පැය ගණන් ඔහේ කතා කර-කර යන්නෙමු; ඒ යන ගමන් විට කමින්, ගස් යට - ගල් උඩ කාලය ගත කළෙමු.

ඈ කියන කවි අතර ජනප්‍රිය ම එකක් වූයේ,

Scanned with CamScanner

''අණේ ගුණේ නැති ගණේ වලව්වේ
වී කෙටුමට පණිවුඩ ආවේ
වී කොටලා මට දුන්න දෙයක් නැත
මැණිකේ හතරට පැළුණාවේ''

නම් කවිය යි. මෙය කවුරුන් විසින් හෝ තමාට වූ අසාධාරණයක් හේතුවෙන් තනි ව ම පබඳින ලද අහිංසක කවියකැ යි මම කාලයක් යද්දී තේරුම් ගතිමි. එසේ අපූරු දේශපාලනයක් ඇති බව මෑතකදී වැටහිණි. මේවා සමහරක් රබන් පද ද විය හැකි ය. එනමුත් කිරිඅම්මා ඒවා භාවිත කළේ නිතර අපට ඇසෙන්නට ගායනා කිරීමට ය. උක්ත කව මාගේ 'සෙංකොට්ටං' නවකතාවේ තිබී දැක මහාචාර්ය සුචරිත ගම්ලතුන් එහි අව්‍යාජ බව ගැන කළ වර්ණනාවල ගෞරවය ද අපේ කිරිඅම්මාට හිමි විය යුතු බව සඳහන් කරමි. මෙකව දැකීමෙන් දෙටු කිවියර රත්න ශ්‍රී විජේ සිංහයෝ තමා අසා ඇති කවි දෙපදයක් දිනක් මට මතකයෙන් කී හ. එය මෙසේ යː

''ගුණේ පණේ ඇති ගණේ වලව්වෙන්
වී කෙටුමට පණිවුඩ ආවේ
වී කෙටුවා මිස දුන්න දෙයක් නැත
ගෙදරට ආවේ හැන්දෑවේ

''අනේ මගේ දරුවනේ හඬන විට
උඹලට මොනව ද මම දෙන්නේ
බණේ සිටින දෙවියෝ අද ඇත් නම්
මැණිකේ හතරට පළවන්නේ''

මෙකව වරක් ඇසීමෙන් අපේ කිරිඅම්මා අර කවිය මතකයෙන් සාදාගත්තා ද විය හැකි ය. කෙසේ වෙතත් මේවා යළි කුමන ආකාරයකින් හෝ මතු කර තැබීම යුතුකමකැ යි සිතමි.

''සබරගමුවෙ දෙමට පඳුර
කපල පලව්වී
තුන් තුන් දෙන කඳ බැඳගෙන
ගමට පලව්වී''

ඒ ඇය තාලයට යමකට තට්ටු කරමින් නිතර කියූ තවත් කවියකි.

''බ ජංගොඩ කෙල්ලෙක් මට

කොන්ද කුදා කීවා
කොන්ද කුදා මට බලන්න
දොර අරින්න කීවා''

ඇය පැදුරු වියන ගමන් නිතර කීවා ය.

''පුංචි බබංචී
උඹෙ කකුලත් ලොන්ඩී
බංකු හිඟන්නී
උඹට කියන්නෙ මැංචී''

කුඩා අප හුරතල් කරමින් කීවා ය.

''ආප්ප කැවුං ඉඳි පිට්ටු කඩේ
තව කිට්ටු කළොත් වරදී ය වැඩේ...''

හඬ බර කර කීවා ය.

''වත්තෙ නැන්දගෙ
රෙද්දෙ තුත්තිරි
සිද්ධ පත්තිනි
දෙවියනේ...''

තාලයට අඩි තබමින් කීවා ය. මා ද ඒවා තාලයට ගායනා කරන විට ඕ ආඩම්බරයෙන් සිනා සුණා ය.

මේවා වැඩි හරිය මෙතෙක් කොහේ වත් ම නොලියැවී මගේ මතකයේ රැඳී තිබූ ඒවා ය. තව මා හට අමතක ව ගිය පුංචි පුංචි කවි ද රාශියකි. මේ සැම පුංචි කවියක් පිටුපස ම එකල සමාජ සංස්කෘතිය, දේශපාලන වටපිටාව, සුළු මිනිසුන්ගේ උපහාසාත්මක දැක්ම වන් කාරණා පිරී ඇති බව පෙනේ. තව ද මේවා වැඩි හරියක් සබරගමු පළාතට අදාළ ව නිර්මාණය වූ ඒවා යැ යි සිතමි.

මම පුංචිකමට ''චිත්‍රපටි කරන්න කොළඹ යනවා'' ය කී කල ''අ-නේ කොල්ලො නිකා ඉඳිං, ඔවුවා අපිට කොරන්න බෑ'' යි ඕ කීවා ය. එනමුත් ඈ මට කොළඹ ගොස් චිත්‍රපටි කරන්න යැ යි කී දිනය අද වාගේ මතක ය. මට අවුරුදු 14ක් පමණ වූ එකල මම ටීවී බැලීමේ අධික

කැමැත්තකින් පසු වුණෙමි. එනිසා ම නගරයේ වූ නිවෙසක බාගේ දොරේ එල්ලී සෙනසුරාදා දිනවල දිවා කාලයේ අනවසරයෙන් ටීවී නැරඹීමේ පුරුද්දක් මට විය. එක් සෙනසුරාදාවක එසේ දොරේ එල්ලී ටීවී බලන කල ගෙහිමියා පැමිණ එක්වර ම උඩ දොර වසා දැමුවේ ය. මට ඉක්මනින් අත ගැනීමට නොහැකි විය. මම ඒ බව අන් කාට වත් ම නොකියා කිරිඅම්මාට පමණක් කීවෙමි. කිරිඅම්මා සුළැඟිල්ලේ වූ තුවාලයේ විට කෙළ ගෑවා ය. ඉන් පසු මා ටීවී බැලීම සඳහා එතනට නොගිය අතර අපි ටීවී-එකක් ගෙන ඒමට පොල් ඉරටු සුද්ධ කළෙමු; කරුංකා වේළුවෙමු; ඇය පැදුරු වියුවා ය. ඒත් ඒ පුංචි වැඩ එකක් වත් හරිගියේ නැත. "උඹ කොළඹ ගිහිං චිත්‍රපටි කොරල සල්ලි හම්බු කොරල ටීවී-එකක් ගෙනාපං!" අවසන ඕ කීවා ය.

එකල අපි ටීවී බලන්න ම දුර ගෙවාගෙන රක්වානේ නැන්දලාගේ ගෙදර ගියෙමු. දිනෙක සවසක එසේ ටීවී බලන කල ළමා නාට්‍යයක් ටීවී-එකේ රඟ දැක්වුණේ ය. අපි ඉතාමත් ම ආසාවෙන් එය නැරඹුවෙමු. එම වැඩසටහන අවසන් වූ පසු එය ඉදිරිපත් කළ රසවත් ළමයා නරඹන්නන් වූ අපට ආයුබෝවන් කීවේ ය. ඒ ළෙන්ගතුකමට පිටුපා සිටින්නට මට බැරි විය. මම ද ඔහුට ආයුබෝවන් කීමි. එතන උන් සැම දෙනා ම මට සිනා සුනහ. ලැ ජාවට මට ඇඬුම් ආවේ ය. පසු දා රක්වානේ සිට මස්ඉඹුලට පයින් එන ගමන් කිරිඅම්මා කියුවේ මා එහෙම ආයුබෝවන් කී එකේ කිසි ම වරදක් නැති බව ය. ඒ නිසා යළිත් මම සතුටු වුණෙමි.

මුල් කාලයේ කොළඹ ඒමට සූදානම් ව ගෙදරින් එළියට බසින හැම වාරේදී ම වාගේ ඕ නැමූ රෙදි අස්සේ මා වෙනුවෙන් ම සඟවා තබාගෙන තිබූ රුපියල් දහය-විස්ස මට දී ඒවා කමිස සාක්කුවට තබා ගසා ගැනීමට හැට්ට කටුවක් ද දුන්නා මතක ය.

අපේ ආතා මිය යන විට මට වයස අවුරුදු දහයක් පමණ ඇත. උදේ පාන්දර 4.00 ට පමණ කුඩා ළමයෙකුගේ වැනි ඉකි ගැසීමක් ඇසී මම අවදි වුණෙමි. අපේ ආතා මිය ගොස් සිටියේ ඉස්තෝප්පු කාමරයේ වාඩි වී භාවනා කරනා ඉරියවුවකිනි. කිරි අම්මා ඉස්තෝප්පු කණුව බදාගෙන "අනේ දෙයියනේ" යි කියමින් හඬමින් සිටියා ය. මා ද ඇය ළඟට ගොස් හඬන්නට වීමි.

මේ සියල්ල අතර ඈ ඊළඟ පරම්පරාවට කියා දුන්නේ මිනිස් බැඳීම්වල වූ අපූරු සංවේදී විචිත්‍රතාව බව මම තේරුම් ගතිමි. එම වේදනාත්මක

Scanned with CamScanner

මිහිරි බව සංසාරය පුරා තව බොහෝ දුරක් රැගෙන යාමට අවශ්‍ය ශක්ති ප්‍රමාණය ඇය විසින් එවක මා නියෝජනය කළ කුඩා ම පරම්පරාවට ලබා දුන් අපූරු පුදුමයකි.

මා ද කවි ලියන බව කිරිඅම්මාට අවසාන කාලයේ ආරංචි වුව ද ඒ පිළිබඳ කිසිදු හැඟීමක් ඇයට නො වී ය. 'මොනවට ද බං ඕවා ලියන්නේ' වැනි හැඟීමක් පළ කළා මතක ය. කවි යනු ලියන ජාතියක් ලෙස ඇය හඳුනාගෙන සිටියේ නැත. එහෙත් මාගේ ළමාකම් හඳුනාගෙන මා වයසේ ම මිතුරියක වෙමින් කිරිඅම්මා එකල මට ලෝකය පිළිබඳ මහා කතාවක් කියා දුන්නා ය. ඒ වෙනුවෙන් මට කරන්නට හැකි වූයේ කාර්යබහුල බව මැද ඇයගේ අවසන් ගමනට හදිසියේ සහභාගි වීම පමණි. ආත්මයේ සියලු ම හොඳ දේවල් අපට දී ඕ එදින සිය දෑත් තම කුඩා කය මත තබාගෙන උන්නා ය. මරණය ගැන පුංචි ම පුංචි කණගාටුවක් වත් නැති බව මුහුණේ වූ ප්‍රසන්න සිනාවක සේයාවෙන් පෙන්නුම් විය.

අද ඇය විසූ ඒ සුවඳවත් භූමිය වල් බිහි ව කැලයට එකතු වී තිබුණ ද ඈ විසින් මා වෙත සුද්ධ-පවිත්‍ර කර දෙන ලද ලෝකය තුළ මම බො-හෝ දුර ඇවිද යමි.

මහින්ද ප්‍රසාද් මස්ඉඹුල
2012-10-23

Scanned with CamScanner

# පටුන


| | |
|---|---|
| සිගිරි ළඳකගේ අම්මෙක් | 13 |
| දයාබර නුගේගොඩ | 14 |
| කලල පුතේ | 15 |
| සිරිපා කවියක් | 16 |
| ආජියගේ මාසෙ පඩිය | 18 |
| පුතාට දහඅට යි | 20 |
| කනත්ත ළඟ පාරේ උදෑසන | 22 |
| බිරිඳගේ කනස්සල්ල | 24 |
| අහිංසකයන්ගේ ආරාමය තිබූ තැනදී | 26 |
| කුලී කාමරයක සිව් දෙනෙක් සහ සඳ | 27 |
| සැඳෑ සමයේ හිරු උදා වී | 28 |
| රහසිගත රැයෙක | 30 |
| ලස්සනට ම දැකපු දවස | 32 |
| සෙනෙහෙ අරණ | 34 |
| දසේ | 35 |
| ඇහි පියන් ඇහැරිලා | 36 |
| පින්තූර කතාව | 37 |
| සියුම් | 39 |
| සැඟවී ගිය කවියාට | 41 |
| ඔබ | 42 |
| වෙනස් ම දවසක් | 43 |
| ගැටවර ම කවියක් | 45 |
| විශ්වය ම කවියක් ව | 47 |
| අමරණීය - ස්වර දේව | 49 |
| මගෙ සිරි, පුතා සහ ජයේ | 50 |
| ඒ පාරේ ම | 52 |
| රහස | 54 |
| අක්කා | 56 |


Scanned with CamScanner

## සීගිරි ළඳකගේ අම්මෙක්

මගේ පැදුරෙන් මිදී කෙල්ලට
වාසලට යන්නට වුණා
අනේ ඒකිගෙ කැකුළු ඇඟ-කඳ
හැම වෙලාවෙ ම සිහි වුණා
මාලිගාවෙන් අපේ ගෙපැලට
තෑගි-බෝගත් හිමි වුණා
සිහිල් ජල කෙළි - දුහුල් සළු පිළි
දුවට හිමි බව සැල වුණා

මහා සීගිරි ගලේ මුදුනක
උඹෙ රුව සිත්තම් වුණා
එය බලන්න ම හොරෙන් හවසක
මාත් එතනට ගොඩ වුණා
කරඬුවක් වගෙ උඹේ උඩු කය
අනෙක් උන් මැද දිලිසුණා.
මගේ හුස්මක් ගැටී වෙන්නැති
දුවේ කළු ගල හෙලවුණා

පපුව ටික ටික මෙළෙක් වෙනකොට
එන්න වෙයි මං දන්නවා
උඹෙ දූවිලි සුවඳ තැවරුණු
පැදුර තාමත් තියෙනවා
දනුත් සීගිරි සිංහයා
කට ඇරන් ඉන්නව පේනවා
ඒ ඉසවුවෙන් යද්දි මං
පොඩි කෙල්ල හංගාගන්නවා

Scanned with CamScanner

# දයාබර නුගේගොඩ

| | |
|---|---|
| අවුස්සන මතකයේ | ඉඩ-කඩ |
| මනුස්සෙකි නුඹ නම් | නුගේගොඩ |
| | |
| මතක අබරණ පලන්දා | ගෙල |
| පාගොඩට සිය නිකට දිගු | කළ |
| දනී සියලු ම කරුණු | සුල-මුල |
| අසල එකකුස උපන් | කොහුවල |
| | |
| සිහින සැමරුම් නහර වැල් | අග |
| එදා මල් තාමත් පිපී | ඇත |
| උඩගුවෙන් හිස පලන්දා | ගත් |
| රිබන් පටියකි ගුවන් | පාලම |
| | |
| බෝම්බෙන් කම්මුල් කැඩී | ගිය |
| අසල හිටගත් නෝලිමිට් | හල |
| වහා කඩිසර වෙළෙඳ | පිරිවර |
| ප්ලාස්ටික් සැත්කමකි සිදු | කළ |
| | |
| මිහිරි දෑ පටලවා | හිත්වල |
| පොඩි කඳුළු බිඳු දෙකක් | එදවස |
| නුඹේ කම්මුල් මත ගලා | ගිය |
| සිහිල මතකයි නේද සකි | සඳ |
| | |
| අතීතේ එක්තරා | සවසෙක |
| එසැවෙමින් විරහවේ | අසිපත |
| කැපී වැටුණා මහ පොළොව | මත |
| සන්තක ව තිබූ එක ම | හදවත |
| | |
| දැනුත් ඉඳහිට ගිහින් | එතනට |
| සෙනඟ අතරේ බලමි | වටපිට |

Scanned with CamScanner

# කලල පුතේ

කාත්-කවුරුවත් නැති කාලෙකදී මට
ඇවිත් නුඹ ගෙනත් දුනි අපමණ සතුට
ඒත් මයෙ පුතේ සිදු වෙයි කියන්නට
තාත්තෙකුත් ඕනෑ ම වූ කලලෙකට

සෙනේ විදි නමුත් කුස තුළ උණුසුමට
දිනේ අදයි වෙන් වී යන්නට අපට
දුනේ වෙනස උඹ ගැහෙනා හැටි බයට
අනේ කඳුළු එනව ද නොවැඩුණු ඇසට

පෑහෙන්නට බැරි වූ ලොව උඹට මට
උඹ වෙනුවෙන් ළැම එරෙනා කඳුළු කැට
පෑගෙන්නට හෙම නොදමා මිනිසුන්ට
පූදින්නට ඉසිනෙමි මල් ගස් මුලට

Scanned with CamScanner

## සිරිපා කවියක්

අම්බලම ළඟ බත් කඩේ
දූවි කර විය ළිප් වටේ
වාර අන්තිම දවස්වල ඒ
ආපු පොඩි සමනල නඩේ
නුඹ නිසයි එතරම් හැඩේ

අම්මලා නිදිගත් වෙලේ
සඳේ දිය වී සීතලේ
ඇයි ද දන්නෑ ඒ වෙලේ මං
අම්බලම විපරං කළේ

සීත ගඟුලේ උණුසුමෙ
සීන කැලැති දිය වුණේ
බැල්මෙ දිලිසුණු නුරා තරුවල
කෝඩුකම දුටු විගසිනේ
තුන්සරණ අමතක වුණේ

ඉර දෙවියො පැවත් සෙනේ
අමුතු අඳුරකි දිස් වුණේ
හුස්ම පිඹ ළිප අස්සෙ කර වී
පත්තු කරගත් ජීවිතේ
නිවී ගොස් තිබුණා උදේ

Scanned with CamScanner

නුඹ දකිද්දී ඇතැ යි ම ය සිතූ
උඩමළුව කෝ හදවතේ

හෙටින් සිරිපා අවාරේ
අපිත් ඉන්නෑ හෙට මෙහේ
ළිහිණි අක්කේ එයා ආවොත්
මා හොයාගෙන යළි හිමේ
මං ගියා කියපං ගමේ

Scanned with CamScanner

# අජියගේ මාසෙ පඩිය

මාසෙ අගදී අඳුරු යායට
සඳ බිඳක් වැටිලා
ගැටගැසී තිබූ පපුව ලිහිලා
බෝඩිමේ හැලිලා
අජියගේ කළු මූණ වෙනදට
වඩා හරි එළිය යි
කවුළු ඇරිලා හිනා පිරිලා
මකුළුදැල් කැඩිලා

සිකියුරිටි උපසේන නං
කලියෙන් නිදාගත්තා
දවසෙ වෙහෙසේ කාන්දම
මාවත් ඇඳට ඇද්දා

රැයේ නිදිවරමින් අජිත්
මොනවා ද ගැළපූවා
මේක අම්මට මෙය තාත්තට
කියා වෙන් කෙරුවා
උකස් කළ අක්කගේ මාලේ
පොලිය ගැන කිවුවා
කොටුරුල් කොළයක් පිරෙන්නට
තව ගණං හැදුවා
පුංචි මල්ලිගෙ පපුවෙ සිදුරක්

ඇතැ යි පැවසුවා
කොළඹ එක්කං යන්න ගානක්
වෙන ම වෙන් කෙරුවා

උදේ බැලුව ම සිකියුරිටි උපසේන
හිටියේ නෑ
ගණං ගැළපූ කොළේ වැටිලා
පෑගිලා තිබුණා

පෙරේදා අපි තුන්දෙනාට ම
බත් මුල යි තිබුණේ
අපේ පැත්තට තල්ලු කර-කර
ඌ ටික යි කෑවේ
කවද හෝ අපි කැඩී වෙන් වී
යන බවක් කියමින්
රැට වෙරි වූ වෙලාවට
අජියා හෙමින් ඇඬුවේ

උපේ, උඹ දන්නව ද අජියා
උඹට මොකවත් කිවුවෙ නෑ
එදා ඌ කල්පනා කර-කර
හිටිය, ඉන් පසු දැක්කෙ නෑ

## පුතාට දහඅට යි

හැම නඩු වාරෙකදි ම වගේ ම
අදත් තරහෙන් ඔයා
මමනෙ දන්නෙ
ඉක්මනින් නිවෙන ඔය තරහ ගැන

උසාවියෙ සෙනඟ අස්සෙන්
බංකුවක දුරට පේන කොට
මතක් වෙනවා
එක ම පන්තියෙ උන්නු කාලය

අත්කොට කමිසය
තාමත් හැඩයි ඔයාට
කියාගන්න තිබ්බනං
යන්න කලින් ඒ ගැන

ඒ කාලේ අපි
එක ම හුස්මක් තුළ
වැඩි ම වාර ගණනක්
ආදරේ කියාගත්ත තරගෙට
ඔයයි දිනුවෙ හැම දා ම

Scanned with CamScanner

බැඳපු අලුත ඔයාලයෙ ගෙදරදී
මතක ද අම්මලට හොරෙන්
බත් අහුරු දාපු විදිහ
මගේ පිඟානට

මසකට වරක් මූණ දැකගත්
මගේ පෙම් කතාවේ
අන්තිම දවස අද

ඉතින් අදින් පසු
නඩත්තු වන්නේ කෙලෙස ද මා හද
ඉඳ-හිට වත්
දකින්න නොලැබෙන කල ඔබ

Scanned with CamScanner

# කනත්ත ළඟ පාරේ උදෑසන

ජීවිත රහස් සඟවා ඇති
සොහොන් පිටියේ
යකඩ වැටට මෙපිට පාරේ
හිරු රැස් ලියයි
දවසේ පෙරවදන

වෙසඟනක්
රෑ වැඩ නිම කර ගෙදර යයි
සිලි බෑගයේ පාන් ගෙඩියකි
මුහුණේ වෙහෙසකි

ලයිට් කණුවක මරණ දැන්වීමක
දුර්වර්ණ සිනහවකි
එතනින් යන ගැහැනියකගේ
කුස තුළ පිරුණු පැතුමකි

දුබල හඬින් කෑගසා
අයෙක් විකුණයි වාසනාව
ඉරාදමයි පරාද වූ හැඟුමක්
තව අයෙක් හැකිළුණු මුවෙන්

Scanned with CamScanner

ඇස් නැති අමයක් වැඩට යන අයට
මාර්ගය පුදා අසින් වෙයි

පෙම්වතෙක් පෙම්වතියට
පලදවයි සිහින
දිලිසෙයි ඇයගේ සිනාව

යකඩ වැටෙන් එපිට
පොළෝ ජේදයක
සොහොන්වලින් ලියැවී තිබේ
ජීවිතයේ පසුවදන

## බිරිඳගේ කනස්සල්ල

වැහි පොදෙන් තෙත් වෙමින්
සොඳුරු අඳුරක් එක්ක
ජිනේ ගෙට ගොඩවෙද්දි
මනමාල ඇස් දෙකෙන්
හදවත ම උගුල්ලා
හොයපු දේ තේරුණා

ඇයි ජිනේ
අමතක ද මේ දවස්?

ඔයාම නෙ කියන්නේ විහිළුවට
පොඩි මාළු බාගනිමු එ-දවසට
ගොඩ ඉඳං කිය-කියා

ජිනේ ඔය කරබාන
තරහෙන් ද නිදියන්නෙ
තරහ ගන්නට එපා
ඒ ගෑනුකමේ හැටි

Scanned with CamScanner

ංආ ජිනේ, දන්නව ද
අරලියා මණ්ඩියට
සුදු ම සුදු වලාකුළ
ගොඩබැහැල වගෙ හවස

වට්ටියක් පුරවලා
මාත් පූජා කළා

වැහි පින්න එක්ක හෙට
ඉඳලෝලු හතු පිපෙයි
මං උදෙන් බලන්නං
ඔයා හරි ආසයි නෙ

ංහා ජිනේ, නිදියන්න
උදේ වෙනකං උණත්
ඔළුව අතගාන්නං...

## අහිංසකයන්ගේ ආරාමය තිබූ තැනදී

උගුල්ලා උඹලයේ අත්තටු
බිම දමූ කල පැටවුනේ
ඉගිල්ලෙන්නට නොහැකි එවුනුත්
උඹලයෙ ම පිට ගොඩ වුණේ
නොසෙල්ලී උහුලද්දි ලක් මවු
ඇය ද රවටා තබමිනේ
කිරිල්ලී විය රජ වෙලා ඇය
උඹල දන්නෑ ළමයිනේ

හිතින් සැඟවූ හදේ වෙඩි හඬ
සිහිනයෙන් මවු ළැමක් ගස්සන
හෙටින් පසු සැනසෙමි සිතාගෙන
පියවරුත් ඇත කලක් තිස්සෙ ම
ඉතින් ඒ හදවත් අසනි වැසි
අතීතය පුපුරවා වැස්ස ම
බලන් එ-දියෙන් තොල් තෙමාගත්
අනාගත සිනහවේ ලස්සන

# කුලී කාමරයක සිව් දෙනෙක් සහ සඳ

තාත්තා:

නුරා කල්පනාවල ඉහිරුණු සිහින
පරාද කරනෙමි දුව-පුතු ලොකු බැවින
ඉරා රැය අදත් ඇවිදින් සඳ මුහුණ
සරාගයේ අන්තිම පෙළටත් රවන

අම්මා:

දුව දෙස බැලිමි දුව සිහිනෙක කිමිදේයා
පුතු දෙස බැලිමි පුතු නිදි ලොව පතුලේයා
සඳ දෙස බැලිමි සඳ වත දෑඩි අඳුරේයා
හිමි දෙස බැලිමි හිමි ඇත මොකවත් නොකියා

පුතා:

දවල් දුටු සඳක් රෑ හොල්මන් කරන
මෙවන් රෑ කොතෙක් පුරුදු ද නිදි වරන
වරක් පැමිණියේ නම් සුන්දර බිරම
සඳක් ගෙන හිතට පහසු ය දිය කෙරුම

දුව:

එවා රැයේ අන්තිම කෙටි පණිවිඩය
මවාගමි සඳේ ඔබ නිදි ඇති විදිය
පමා නොවී එළැඹුණු විට හෙට දිනය
සොයා එමි උදේ මට හිමි සඳ එළිය

Scanned with CamScanner

## සැඳෑ සමයේ හිරු උදා වී

දවල් කෑමට ඉද්දි
අපි ගෑනු පෝලිමේ
බොඳ රූපයක දුරින්
පෙනෙන ඒ අහම්බය
ඔහු වත් ද?
පිඟානක් අත ඇති ව
පිරිමින්ගෙ පෝලිමේ
ඔව්... ඔහු ය

අද දවස මේ තරම්
පුදුම වූ එකක් බව
මගේ ඇඳ ළඟ ඉන්න
යසවතීලට - බිසෝනෝනලට
කොහොම නං කියන්න ද?

අමතක ම නොවෙන ඉස්සර දාක
ඔයා නොකියා ගියෙන්
ගෑනියෙක් මොනව නං කරන්න ද?
"අද ම බඳිමු" යි කියූ
යකඩ වගෙ කටහඬක
ඒ නිසා ජීවිතය ඇමිණුවෙමි

Scanned with CamScanner

දරුවො සලකන්නැද්ද?
බිරින්දෑ මියගොස් ද?
මෙහෙට ආවේ අද ද?
ඒව දූං මොනවට ද?

මාව හිරිවට්ටාපු
නොලැබුණොත් මරාගෙන මැරෙනවාමයි කියූ
ඒ බොළඳ ආදරේ
මොන තරං පුදුමයි ද?

අහම්බෙන් දුටු විගස
ලොකු කොලුගෙ කළු මුහුණ මතක් වුණි
ඒ රහස අදට වත්
කවුරු වත් දන්නෙ නෑ

දූං ඉතිං හැමදා ම හැන්දෑවෙ
පිරිමි පැත්තට ඇවිත්
ඇඳ ගසා හදා දී
නින්ද යනකං ඔහේ
කතා කර-කර ඉන්න
අපිට පුළුවං වේවි

## රහසිගත රැයෙක

මේ අඳුර තුළ
අපමණ දේවල් සිදු නො වෙතැ යි
කෙසේ නම් කිව හැකි ද?

නටු අග ප්‍රසූත වේදනා මැද
පුංචි මල් පිපෙනවා ඇත
කාටත් රහසේ ම

විශ්වයේ විසල් ම රහස් හංගාගෙන
තරු යාය බලා හිඳී
රැය දෙස

ඉහළ අතුවලින් බේරෙන
පිනි කැටවල වේදනා
තුනී වී යනවා ඇත
ළා තණ පත් මත වූ මිනිස්කම ළඟ

මහ පොළොව හුස්ම ගනී
හෙට උදේ ම උපදින පැළයට
ජීවිතය උගන්වන්නට

නිහඬ ය මුළු අවකාශය ම

Scanned with CamScanner

කාලය ගමන් කරන නිසා තමන් අතරින්

වැඩිපුර ම කල්පනා කරන්නේ පුංචි ම දළු ය
හිරු හෙට අරගෙන එන දේවල් ගැන

සැලසුම් කරයි විශ්වය සිය රටාව
නිහඬ ව ම මුමුනයි
උල්පත්වලින් උනන ප්‍රේමය ගැන
පරාගවල තැවරුණු රාගය ගැන

මවු කෙනකු වාගේ ම ය සුළඟ
පැතිරී ලොව පුරා ම
සියලු ම පුතුන් නිදාගත් පසු
ගස් අතු මත ලැගුම් ගෙන
අතගාගනී තම අත-පය
හෙට උදේ වැඩ කන්දරාව සිහි කර

Scanned with CamScanner

## ලස්සනට ම දැකපු දවස

මතක් වෙනව මට එයාව
ලස්සනට ම පෙනුණු දවස
අපේ අත් පැටලුණු - ලිහුණු
මාවතේදි ම දවසක්

එදා මුළු ලෝකෙ ම හැඩගැහුණා
මගේ ඇස් තුරුලෙ ඒ රුව හිඳුවන්න

එයා නතර වුණා
මහ බිල්ඩින් දෙකක් මැදින් ආපු
ඉරේ පින්සල් පාරකට හරියට ම කෙළින්

හිරු සායමේ කැලතී
මතු වුණා විස්මිත රූ රහස

මම ගොඩක් ම ආදරේ දැනෙන්න
බලන වෙලාවෙ ම යි
එයා අනවශ්‍ය ඇහිපිල්ලමක් ගැහුවෙ

මාව ගලක් කරලා
එයා දිය වෙලා ගියා හිත පුරා ම

Scanned with CamScanner

මෙතෙක් කල් ගලා ආ කාලයෙන්
හොඳ ම කොටසක් වෙන් කරගෙන මම
ඒ කොටසෙ පිරෙව්වා
'මං ඔයාට කැමතියි' කියන වචන

ඒ කාල කොටස
ඔයා ඔයාගෙ ම කරගත්තා

පස්සෙ ඒක ඔයා අතින්
නැති වෙලා තිබුණා

Scanned with CamScanner

## සෙනෙහෙ අරණ

සඳ පොළොව මත තියපු
මුදු පා රටාවේ
හුරු-පුරුදු ගතියක් තියේ
දුරු රටක අහසේ
ගන අඳුරු තීරේ
තරු අතර කඳුළක් දිලේ

අලුයමට බිය වූ
පපුවෙන් සෙමෙන්
රිය ගැහෙන සුසුමක් හෙළයි
ඔබ වෙසෙන මතකයක
දළු ලන රැහැන්
සිත් නහර අලුතෙන් ගොතයි

ඔබගෙන් ම හිමි වූ
කවියකට ඉඩ දී
විශ්වය ම
නිහඬ ව හිඳී
සීතල සිනාවක්
ඇතින් ගලා විත්
ජීවිතය පොඟවා තබයි

Scanned with CamScanner

# දසේ

ඉර තරහ වෙන පෙළක් සවසක
උඹ එනව හඳ මූණෙ ගාගෙන
සතුට හැම තැන ඉසින වපුරන
පුදුම හිතෙනව දසේ උඹ ගැන

උඹෙ කතාවල පිරී ඉතිරෙන
ඇඹුල - පැණි රස - තිත්ත රස මැද
හිනාවල ඇත්තේ විටින් විට
දිස්නෙ දෙන හරි වටින මිණි කැට

ජීවිතේ සමහර කතා ගැන
පුංචි රහසක් ඉතිරි කරගෙන
අප රහස්වල තියෙන දුක දැන
සොයයි පිළියම් දසේ අපමණ

උඹේ දුකකදි හිනා වීගෙන
අපේ දුකකදි එයි අඬාගෙන
තැළුණු හැකිළුණු ජීවිතේ පෙති
දිගහරී හෙමිහිට මලක් මෙන

අපට මදි වෙයි කියා හිතමින
පුංචියට බත් කටින්-කට කන
ලොවේ අට වෙනි පුදුමයයි උඹ
වතුර වැඩිපුර බීල නිදියන

කලාතුරකින් දූනුදූ සවසක
අලුත් විසකින් හිත රිදෙන විට
මූණෙ ගාගෙන සිනා අවුසද
උඹ එතැයි මඟ බැලෙයි නිකමට

## ඇහි පියන් ඇහැරිලා

ඇස්වලින් රූ පෙරා
රැස් ගඟුල තුළ හොරෙන් ගිලෙමී
රශ්මි රන් නෙත් කැලුම්
පස්සෙ අරගන්නටත් තියමී

වස්සානයක රැඳී
තිස් පැයේ තෙමී-තෙමී දූවෙමී
ගස් බලටුවල පවා
ලස්සන ම ගැහැනු ඇඟ දකිමී

පස් මහා බැලුම් ලා
ඇස් පියල්ලක පහස සොයමී
ඉස්තරම් මඟුල් කා
හස්තයෙන් මධුසමය විඳිමී

## පින්තූර කතාව

පැතුම් අහිමි වේ යැ යි
නිකමට වත් නොසිතූ
එකල අපේ හිනා පිරි මුහුණු පෙළ

ලැමිනේට්න් ප්‍රතිකාර අහිමි ව
තුවාලවලට
තාවකාලික පුළුන් කැලි තබාගෙන
අමුතු රිදීම් සමග
අල්මාරියේ වැඩ-වසන
ජීවිතේ මහාවංසය

නුවරඑළියේ ගිය
සීතල ම සීතල විනෝද ගමනක
හිමි වෙතැ යි ම සිතා උන්
සුදූ මුහුණක තිබූ
රහස් බැල්ම

නෙළුම් මල් අතැති ව
වෙහෙරහේනෙදි
සදා වෙන් නොවෙමු යි පැතූ
පරණ මුහුණුවල අලුත් බව

Scanned with CamScanner

බෙලිහුල් ඔයේ නාපු දවස
යුගයක් ජීවත් කළ
ඇඟට ම ඇලුණු ළා කොළ පාට දිය රෙද්ද
එයා දං කොහෙ ඇද්ද?

ජීවිතේ එක ම බලාපොරොත්තුව
ඇස්වල පුරෝගෙන
ස්ටුඩියෝවේ
නන්නාඳුනන ඇඟවල් දෙකක ඇලවූ
පවුඩර් පිරි අපේ පුංචි මඟුල් මුහුණු

කොතෙක් පෙරළුව ද
නොහැක යළි මුල සිට එන්නට
අවසානය කරා ආ ගමනක
තැන තැන දමා ආ
ජීවිතයේ කැබලි
සිනා සෙන්නේ අදත්
යමක් දැනගෙන ද?
කිසිවක් නොදැන ද?

Scanned with CamScanner

## සියුම්

මතක නැහැ මට කිසිත්
රෝස පැහැ නුඹෙ මුහුණ පසුබිමේ
විහිළු මඳ නල වැදී
සිනා සෙලවුණු විදිහ
මතක නැහැ

සමු ගන්න ළා අඳුරෙ
දුකින් පෙඟවූ මුහුණ
යන්තමට ඇල කරල
'හෙටත් එන්නං' කියන වචන දෙක
ගලා යන්නට ඇරපු
සිහිල මට මතක නැහැ

තේරුමක් නැති දේක
වාදයක කෙළවරෙක
හීනි කඳුළැලි අකුරු
මූණෙ ලියැවුණු දාක
'මුකුත් නොකියා ටිකක්
ඉන්න දෙන්නැ' යි කියූ
සියුම් වේදනා හඬ
කොහෙත් ම මතක නැහැ

Scanned with CamScanner

සෙනේ පිරි බස්-එකක
කෙස් කැරැල්ලක් හොරෙන්
හීනාවල වැදි-වැදී
කරපු දඟකාරකම්
ඒක වත් මතක නෑ

පිහිළුවක අගිපතින්
හිත කැපුණු දවසකදි
හීනාවල දිය කරපු
ඉතා හොඳ ඔසු වචන
උදෙන් අරගෙන ඇවිත්
හදවතේ ගල්වාපු
විදිහ මට මතක නෑ

අන්න ඒ සියලු දේ
මතක නැති හින්දා ම
කිසි දාක ඔයා මට මතක නෑ

Scanned with CamScanner

# සැඟවී ගිය කවියාට

සඳෙන් අලුත් කැටයම් පොළොවට      වැටුණී
ලෙනෙන් නුඹෙ කවි පද පසුවට      පෙරුණී
නමුත් නොකියා ම රැව නුඹෙ වසන්      වුණී
මටත් ඉතින් වැඩි-වැඩියෙන් දුක      දැනුණී

ඉබේ කඳුවලින් පහළට ඇද-      හැලුණේ
නුඹෙ කවි කියා කියලාමයි      හිතුණේ
අනේ අපට නොකියා ගිය සකි      සඳුනේ
දැනේ නොමියෙනා සුසුමක සිසිල      දැනේ

සිතක් නම් කොහෙ ද ආයෙත් නුඹ      වැන්න
නැතත් මක් වෙයි ද ඉර හඳ තරු      ගොන්න
විතක් යළිත් කවියක මධු      කලතන්න
මතක් වෙයි එවිට හෙට ඉර      පායන්න

## ඔබ

ලොවේ රළු බව
පිරිමැදී යයි
මෙවන් මැදියම් රැයක දෑතට
දූනෙනවා ඇති
දුර ම තරුවට
විශ්වය ම එක ගමක් විදිහට

දුක හිතුණ කල
විසල් අහසට
බිමට වැටෙනව වැස්ස විදිහට
යළි උදේ පත් වෙනව මරණෙට
පණ ඉතිරි වූ
පුංචි පිනි කැට

ලිහුණු මුතු මාලයක් වී ඔබෙ
මතක ඔක්කොම
විසිර යන විට
එකින් එක
පෙළගැසෙයි අහසට
මට පේන්නට පුංචි තරු කැට

Scanned with CamScanner

# වෙනස් ම දවසක්

ඇසෙන්නේ නෑ රාණි අක්කගෙ
කැස්ස සහ බෙලෙක්ක සද්දය
සැරයටිය යයි මා රැගෙන
පඩිපෙළෙන් යකඩ වැට දිහාට

මිනිස් සිරුරු වැඩ ඇරී යනු දූනෙයි
වේගවත් සුළං රැළි ගසාගෙන

නෑසේ බෙලෙක්ක සද්දය
ආවා කැසට් කඩේ ළඟ තුන්වෙනි පඩියට
මුලින් ම අපි ඇගේ හැප්පුණු තැන

එදා ඒ පොද වැස්ස
අපි ඇති තරං කුණුහරුප කතා කිය-කියා
පාලම යට හිනා වුණු රැය

උඹ පිරිමි ගැන කියපු කතාවලින් පස්සෙයි
මං තේරුං ගත්තේ
දහ-පහළොස් දෙනෙකුට රැවටුණ වග

අපි යහමින් සල්ලි හොයපු පෝය දවසක
මට ඕනි උණේ ම
සංගීත සන්දර්ශනේ අහන්න යන්න
උඹ ඕනි කිවුව පංසල් යන්න

Scanned with CamScanner

පන්සලේ උස තාප්පෙට පිටිං ඉඳං
අපි එළි වෙනකං බණ අහපු රඟ

දන්සලේ පෝලිමේ
දෙවෙනි සැරේටත් ඉන්නකොට
අපිට ඉංගිරිසි පන්තෙන්
එකේක ඒවා කියපු නෝනලාට
අපි ඇවිත් ඇද කර-කර
හිනා වුණු විදිහ

උඹ යි අක්කේ හුරු කළේ මට
ගණං අඩු සයිවර් කඩ
නගරසභා කක්කුස්සි
දවල්ට දොට්ට යන්න පුළුවන් කිට්ටු තැන්

මොක ද මන්දා මේ සේරම පෙළට
මතක් වෙනවා අක්කේ මට
මේ නෙක සද්ද-බද්ද අතර
නෑසෙන කල උඹේ රත්තරං
කැස්ස - බෙලෙක්ක සද්දය

## ගැටවර ම කවියක්

ඇගේ හැරයෑම හින්දා
එපා වුණා කෙල්ලො සංහතිය ම

සාප කළා උන්ට
විසි කළා සරස්වතී පින්තූර පවා
ඉරුවා මොනාලිසා රූපෙත්
යස යි කියල හිතුණ අත් නැති වුණ-එක වීනස්ට

*     *     *

ගිය සිකුරාදාවක එකියක්
අත් උස්සලා කොණ්ඩෙ බඳිනවා
හීනෙන් දැකලා
ඇහැරුණා මාව එකපාරට ම
දාඩිය දමාගෙන

තනි වුණා තව එකියක් එක්ක
දවසක් කෝච්චි පෙට්ටියේ
හීනි ඇඟිලි - කොණ්ඩේ ස්ට්‍රේට්

Scanned with CamScanner

බස් එකකදි වැලමිට ගැවුණා
සාරියක් ඇඳගත් එකියකගේ
බඩ හරියේ
සීතලට දූනුණා
ඇඟි බැමි ගාලා නෑ
ඇහිපිල්ලම් ගැහුණෙ අඩුවෙන්

හවස වැඩ ඇරිලා යන
ඉක්මන් කකුල් අතරේ
අඩිය තියනකොට දම්පාට ගැහෙන*
එහෙවු විළුඹක් දැක්කේ එදා විතර ම යි

හවස් යාමවල්වල
පාලම ළඟ හිටගෙන නිකමට වගේ
පැය ගණන් බලා හිටියා
ඒක ආයෙමත් දකින්න

ඒ තරං උනන්දුවකින් නොවුණත්
ඊට පස්සේත් හැමදා ම වාගේ
ගැවසුණා ඉස්ටේසම ළඟ
පන්ති ඇරෙන තැන්වල - පොත් කඩ ළඟ

* 'අඩිය තියනකොට විළුඹ දම්පාට ගැහෙන' අදහස අජන්තා රණසිංහයන්ගෙන් හොරකං කෙරුවේ ගැටවරකමට බව පසුව තේරුම් ගතිමි.

## විශ්වය ම කවියක් ව

ලොවේ හෙවණැල්ලෙන් ම
ලොවේ පැත්තක් මෙසේ
අඳුරු වූ යාමයෙහි
මිනිසුන්ගෙ ළා පුසුඹ
දසත විසිරී හැලෙන වෙලාව යි

සුසර වෙයි සොබාදම
වැයෙන්නට විශ්වය ම සිසාරා

නිහඬ බව කෙළවරක වූ හඬෙක
ඇති සියුම් ගීතවත් බව සෙමෙන්
රහස් නින්දක යෙදෙන
කවි ලියන සිත් අසල ලැගුම් ගයි

කැඩී විශ්වයෙ දොරටු සැම සැණින්
පලා යන්නට තනන
සුවඳකට වුව යන්න ඉඩ තිබෙයි

ඉතා හොඳ දේ හමාගෙන ඇවිත්
හඬන මිනිසුන්ගෙ මුව මත රැඳෙයි
පුපුරන්න කිට්ටු ගිනි කඳු කනට
සුළං තොල් සෙමෙන් රහසක් කියයි

Scanned with CamScanner

මළ කයක් ළඟ හඬන ඇස් අසල
දූන් පිපුණු පොඩි පැටව් සිනා සෙයි
ලෝක සිතියම් සියල්ලෙහි පවා
අප අපව වෙන් කෙරූ ඉරි මැකෙයි

හොඳ ම වචනෙන් සැදුණු සියලු කවි
සඳේ ඇති මුහුදු මත මුහු කෙරෙයි
සියලු ප්‍රතිමා සොහොන් කොත් කැඩෙයි
සඳට මුළු පොළොව තෙමී-තෙමී පෙඟෙයි

නිදි ලොවෙහි හුදෙකලා නිම්නයක
සොබාදම සුසර වී
වැයෙයි - නැවතත් වැයෙයි - යළි වැයෙයි

Scanned with CamScanner

# අමරණීය - ස්වර දේව

සුළඟේ ගීතවල ඇති නෙක නෙක සද්ද
වැස්සේ ස්වරය ගඟුලේ තත් පිරිමැද්ද
මේවා තනි ව සිදු වන්නට පුළුවන් ද
නැත් නම් ඔබෙන් හොරකම් කෙරුවා වත් ද

අමතක නොකර සංසාරයෙ ගති- පුරුදු
ගිනි ගෙන දැවෙන ලොව මඳ සිහිලෙන් නිවපු
ඔබෙ හඬ මුළුමනින් තනුවකි, ඒ නමුදු
නිහඬ ව ඉන්න විට වුව තනුවකි අමුතු

Scanned with CamScanner

## මගෙ සිරි, පුතා සහ ජයේ

මා දෙනෙත්වල බොහෝ දෑ සොයා
ඉතා කෙළිදෙළෙන් සරසවි බිමේ
ජයේගේ ඇද අකුරු එකතු වී
ගෙතුණු පදවැලක් විය මතකයේ

මෙදා ඔහුගේ ම ස්වරයෙන් සැදී
ගීතයක් වෙමින් එ-වදන් ගැයෙයි
මගෙ සිරි හා පුතු ද මා ද විය
මහත් පුදුමෙකි මෙදින රඟහලේ

ආයෙ අපි හමු නොවෙමු කී මුවින්
ආයෙ හමු වෙමු යි ගීයෙන් ගැයෙයි
යමක් දත් සිරි මා දෙස බලයි
ඒ නොදත් පුතු හඬා කිරි සොයයි

ජයේගේ මියුරු ඇස් දෙක තුළින්
අතීතේ විරහ කඳු මට පෙනෙයි
ජයේගේ අමුතු කටහඬ තුළින්
වේදනාවේ වලා අලුත් වෙයි

Scanned with CamScanner

අතරමං වූ විටෙක ඒ යුගේ
සිරි තමයි ජීවිතේ පෙන්නුවේ
දූනුදු පුතු නළවමින් මගෙ සිරී
අතීතේ කිමිදෙන්න ඉඩ සදයි

පුතු හැඬුම මගෙ විඳුම ළඟ නිසා
සිරී පුතු රැගෙන එළියට දුවයි
ගැහැනියකගේ සියුම් ජීවිතේ
දිනෙක සිරිගෙන් පුතුත් ඉගෙනගයි

Scanned with CamScanner

## ඒ පාරේ ම

හැන්දෑ යාමයක
සඳට පමණක් කියා
ඇය කැන්දාගෙන එන්නට ඇත ඔහු
මේ පාරේ ම
ඔහුගේ ලොව වෙත

ල ජාවේ මුහුණුවරින්
පා තබන්නට ඇත ඔවුන්
රැයෙහි නැවුම් ම නැවුම්
විරුද්ධ පදය වූ
දහවලෙහි ළා බාල ම වියට

ජීවිතය හුරු-පුරුදු වුණු පසු
අප ලබන්නට
සිහින පුරෝගත් සිතින්
ඒ පාරේ ම යන්නට ඇත සෙමෙන්
ඉස්පිරිතාලයට

අලුත් ම පැතුම් හරහට වඩාගෙන
පරිස්සමින් එන්නට ඇති
ඒ පාරේ ම ගෙදර

Scanned with CamScanner

ඒ පාරේ ම
නව ලොව ගලා ආවේ අප වෙත
නව පුසුඹින් ය

අපූර්වත්වය සොයාගෙන
අප යන කල ඒ පාරේ ම
ඔවුන් යනු ඇත
හතියට බෙහෙත් ගේන්නට
ප්‍රෙෂර් බලවාගන්නට
වෙසෙසින් ම පන්සලට

කාලය කොහේ ගමන් කළ ද
එක ම එක පාරකි සංසාරය
සදා අප යන-එන

## රහස

වෙසක් තොරණේ සිහින අතරේ
බොහෝ ජනයා ගැවසුණා
දුවේ, ඊතල සහිත බැල්මක්
නුඹේ අසල ම නැවතුණා
ඒක දැකලා නුඹේ නෙත් යුග
තොරණ පරදා දිලිසුණා
කිසිත් නොදුටුව කෙනෙක් වගෙ මං
මතක නැවකට ගොඩ වුණා

අද වගේ පෙර වෙසක් දවසක
සඳ අහස මුදුනට වුණා
දුවේ, උඹෙ වගෙ ඇස් දෙකක් මට
මෙන්න මෙතන ම හමු වුණා
එදා රටකජු ක-කා ළං වී
හීනවල අපි රජ වුණා
මගේ කන ළඟ ගෙතුණු රහසට
බෑ කියන්නට බැරි වුණා

අනේ මංදා ජීවිතේ හැටි
පහුවදම සඳ හැංගුණා
බොහෝ දේවල් අහිමි වී ගොස්
දුවේ, උඹ මට හිමි වුණා

Scanned with CamScanner

ජීවිතේ කලතවන එ-සතුට
මුලින් පුන්සඳ වෙයින් එයි
මෝදු වී මුදුනට ම එක්වර
පසු ව කන්දට මුවා වෙයි

ගෑනු අපි ඉදිරියේ නිතර ම
එහෙම කන්දක් තියෙනවා
සඳ වැසුවට අවුව කාලෙට
එය ම සෙවණත් සදනවා

Scanned with CamScanner

## ඈස්සා

රූම්-එකේ දොර ඇරල දෙන වෙලාවේ
මං අඳුරගත්තා පටිය කැඩුණු සෙරෙප්පුව
දනුණා ත්‍රිපෝෂ සුවඳ
මූණ බැලුවෙ නෑ මං
යතුර වැටුණා මා අතින්
කස්ටමර් කෑගෑව
ඉක්මං කරපං කොල්ලෝ කියලා

අල්ලපු කාමරේ ඉඳං
හිල්වලින් බලන ගමං
විජේලා කියනවා ඇහුණා
බඩේ ළමයෙක් හම්බවෙච්චි ඉරි තිබ්බට
ඒකි පුරුදුකාරියෙක් නොවන වග

මට මතක් වුණා
අම්මා නාවන්න
පොඩි එකාට බෙහෙත් පොවන්න
මස්සිනාගේ මුත්‍රා බටේ ගලවන්න
උදේ ම නැගිටලා කවර අලවන්න
ඒකිට තිබ්බ පුරුද්ද

ත්‍රීවීල්-එක ගියාට පස්සේ
ඇඳ අස් කරන්න කලින්
කොට්ටවල තිබ්බ කඳුළු වේළෙනකං
ෆෑන්-එක වැඩි කරල මං
එළියට බැහැල
ඔහේ ඇවිදගෙන ගියා ටික දුරක්